# භරතාචාර්ය නිර්දිෂ්ට නාට්‍යගෘහය හා වර්තමාන නාට්‍යාගාරය

පනාවල ධම්මධජ හිමි[1]

භරතාචාර්යයන් විසින් දක්වන ලද නාට්‍යගෘහය කෙබඳු වූවක් ද යි සාකච්ඡා කිරීම හා නූතනය එය යොදාගෙන ඇති ආකාරය සැසඳීම මේ පර්යේෂණයෙහි පරමාර්ථය යි. භරත මුනිවරයා ස්වකීය නාට්‍යශාස්ත්‍ර කෘතියෙහි ලා නාට්‍යගෘහයක් සකස් කිරීමේ දී ගත යුතු දිග හා පළල සහිත ව ස්ථාපන ක්‍රමවේදයක් දක්වයි. දෙවියන්ට, රජවරුන්ට හා සාමාන්‍ය ජනයාට නිර්දිෂ්ට නාට්‍යාගාරයන්හි ප්‍රමාණය එකිනෙකට වෙනස් ය. මේ නාට්‍යාගාර අතුරෙහි මිනිසුන් උදෙසා නිර්දිෂ්ට වන්නේ රජවරුන් උදෙසා භාවිත නාට්‍යාගාරය යි. එය මධ්‍යම ප්‍රමාණයේ නාට්‍යාගාරය යි. ප්‍රමාණයට වඩා කුඩා වීමෙන් හා විශාල වීමෙන් නාට්‍යාගාරයෙහි විවිධ දොස් හටගන්නා අතර නාට්‍යාගාරය ඉදිකිරීමේ දී ඇති වන දෝෂ හේතුවෙන් ඒ නාට්‍යාගාරය හිමියාටත් නාට්‍යාචාර්යවරයාටත් ජීවිතයෙන් වන්දි ගෙවන්නට සිදු වන අවස්ථා ද මෙහි නිරූපිත ය. නූතනයෙහි නාට්‍යශාස්ත්‍රයට අනුව ම නාට්‍යාගාර ඉදි වන බවක් නො පෙනේ. නූතනයෙහි අතිශය ප්‍රසිද්ධ නාට්‍යාගාරයන් ලෙස බොරැල්ලේ මානෙල් නාට්‍යාගාරය, ටවර් නාට්‍යාගාරය සහ එල්ෆින්ස්ටන් නාට්‍යාගාරය දැක්විය හැකි අතර ඒවා කෙතෙක් දුරට මෙකී ශාස්ත්‍රයට අනුගත වී ඇත්දැ යි නිරීක්ෂණය කළ යුතු ය. උදාහරණයක් ලෙස කොළඹ දිස්ත්‍රික්කයෙහි බොරැල්ලෙහි පිහිටි මානෙල් නාට්‍යාගාරයෙහි දෘශ්‍යමාන ප්‍රමාණය හා එහි පිහිටීම සලකා බැලිය හැකි ය. එහි සම්පූර්ණ දිග අඩි හතළිහක් පමණ වන අතර පළල අඩි තිහක් පමණ වේ. රංගපීඨය අඩි දෙක හමාරක් උසින් යුක්ත ය. නේපථ්‍යාගාරයට පිවිසීමට දොරටු දෙකක් ද රංගපීඨයට පිවිසීමට දොරටු දෙකක් ද වේ. මෙය මහල් හතරකින් යුක්ත ය. නාට්‍යශාස්ත්‍රයේ නිර්දිෂ්ට නාට්‍යාගාරයත් මේ නාට්‍යාගාරයත් අතර සමානතාවන්ට වඩා විෂමතාවන් ගහණ වී ඇත. මෙයට හේතුව වන්නට ඇත්තේ නේපථ්‍යාගාරය සැකසීමේ දී ප්‍රේක්ෂකයන්ගේ වර්ධනය වීම හෝ නාට්‍යාගාර සකස් කරන්නන් නාට්‍යශාස්ත්‍රයට අනුගත වී නොමැති වීම යි. කෙසේ හෝ අවසාන නිගමනය වන්නේ නූතන නාට්‍යාගාර භරත මුනිවරයා දක්වන ලද නාට්‍යාගාරයන්ට වඩා වෙනස් වී ඇති බව යි.

**ප්‍රමුඛ පද:** නාට්‍යශාස්ත්‍ර, භරත, නාට්‍යගෘහ, නේපථ්‍යාගාර, නූතන නාට්‍යාගාර, ප්‍රමාණය

[1] සංස්කෘත අධ්‍යයන අංශය